වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2019

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 311

නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය,
5 වන මහල, 1 වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල
දු.අ.-0112872054/0112887164
ෆැක්ස්- 0112872061/0112872048
ඊ මේල්-info@nppd.gov.lk

අන්තර්ගතය

පරිච්ඡේදය 01 – ආයතනික පැතිකඩ	02
පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම	06
පරිච්ඡේදය 03 – වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	12
පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශකය	25
පරිච්ඡේදය 05 – තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	26
පරිච්ඡේදය 06 – මානව සම්පත් පැතිකඩ	27
පරිච්ඡේදය 07 – අනුකූලතා වාර්තාව	30

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශිය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතුවූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරිම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින් 2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය කරන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලැස්ම, කලාපීය භෞතික සැලසුම් සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් සැකසීම, ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීන කිරීමත්, පූජා භූමි සංවර්ධනය උදෙසා ව්‍යාපෘති සැලසුම් කිරීම හා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් සමග ඒ සඳහා වින්‍යාස සැලසුම් සැකසීමත් අතින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට වසර හැත්තෑවකට ආසන්න සේවා ඉතිහාසයක් ඇත.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් නවයෙහිම පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් සූක්ෂම ලෙස භාවිත කරමින් ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින් ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම්වලින් යුතු නගර ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම ආදී කර්තව්‍යන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අති මහත්ය.

මෙම කර්තව්‍යන් ඉටු වන්නේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, කලාපීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශවල සාමූහික කැපවීම මතය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු"

මෙහෙවර

" ජාතික භෞතික ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම"

අරමුණු

1. ශ්‍රී ලංකාවේ සැලසුම්ගත තිරසාර හා සොඳුරු භෞතික සංවර්ධනයක් අරමුණු කරගෙන, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම නිර්මාණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම්කරණයක යෙදීම.
3. භෞතික සංවර්ධනයන් සැලසුම් කිරීම සඳහා ඕනෑම ආයතනයකට හෝ සංවිධානයකට අවශ්‍ය සහයෝගය ලබාදීම.
4. විශ්වාසනීය හා ඵලදායී සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සංවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාව සඳහා ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම සකස් කිරීම.
2. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සමග සැසඳෙන කලාපීය හා ප්‍රාදේශීය සැලසුම් සකස් කිරීම.
3. ඉඩම් සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම.
4. ස්වභාවික ලෙස විසිතුරු ස්ථාන සහ ගෘහනිර්මාණමය ඓතිහාසික වශයෙන් වැදගත් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, යටිතල පහසුකම්, පොදු පහසුකම් හා සේවාවන් සැපයීම තහවුරු කිරීම.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
සංවිධාන සටහන



1.5 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන අංශවලින් සමන්විතය.

2. ජාතික හා කලාපීය භෞතික සැලසුම් අංශය
3. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය
4. ඉංජිනේරු අංශය
5. වාස්තු විද්‍යා අංශය
5. පර්යේෂණ අංශය
6. සම්බන්ධීකරණ හා නියාමන
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

1.6 2019 වසරේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අරමුදල් මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු අතර, පසුව නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය මගින් ලැබුණි.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

විශේෂ ජයග්‍රහණ

1.) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2019 වසරේ ප්‍රධාන ජයග්‍රහණයක් වන්නේ ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය සංශෝධනය කර ගැසට් කිරීමයි.

2.) 2019 වසරේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද අනෙකුත් ව්‍යාපෘති

I. කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ පහත සඳහන් ව්‍යාපෘති සිදු කරන ලදී.

a) පොදු පහසුකම් ගොඩනැගිලි ඉදිකිරීම

- කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ උතුරු පිවිසුමේ, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තු කාර්යාලය අසල, කිරිවෙහෙර අසල මෙම ඉදිකිරීම සිදු කර ඇත.

b) පොලිස් මුරපොලවල් ඉදිකිරීම.

- කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ පාලම් අංක 03 අසල ,ගෝතමීගම පිවිසුම අසල , නැගෙනහිර පිවිසුම අසල ඉදිකර ඇත.

c) කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය වටා ඇති වැට ඉදිකිරීම

d) රථගාල ඉදිකිරීම

II. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ ව්‍යාපෘති කාර්යාලය වැඩ ආරම්භ කිරීම ඉඹුලකන්ද ශ්‍රී සම්බුද්ධි විහාරයෙහි ධර්ම මණ්ඩපය සහ භාවනා කුටි සහිත කාමර (මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ) ඉදිකිරීම

III. මීවිටිගම්මන නාලිකේකාරාම විහාරයෙහි ඉදිකිරීම් (මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ)

IV. නාරම්මල සුමනකීර්ති පිරිවෙනෙහි ඉදිකරන ලද දාන ශාලාව සහ රැස්වීම් ශාලා ගොඩනැගිල්ල වැඩ නිමකර සසුනට පූජා කරන ලදී. (මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලදී)

V. මාබිම සීවලී ආරණ්‍යයෙහි භාවනා කුටි සහිත ගොඩනැගිල්ල මෙම ගොඩනැගිල්ල ද මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ කරන ලද එකකි.

VI. ලෝලුගස්වැව ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම ආරම්භ කිරීම.

3.) 2019 වසරේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්. සකස් කරන ලදී.

I. තිරියාය ගිරිහඩුසෑය විහාරයේ බෝ මළුව සහ ධර්ම මණ්ඩපයක් ඉදිකිරීම.

II. අම්පාර පුංචි සීගිරිය විහාරය සඳහා කෞතුකාගාරයක් ඉදිකිරීම සහ දළ වින්‍යාස සැළසුමක් සකස් කිරීම.

III. වැල්ලම්පිටිය සෙනෙවිරත්නාරාම විහාරයෙහි භූ දර්ශන සැලසුම හා ඊට අදාළ ඇස්තමේන්තු සකස් කර භාරදීම (" සිහිලැල් දැහැන" ව්‍යාපෘතිය යටතේ)

IV. කෝට්ටේ රජමහා විහාර පූජා භූමියෙහි යෝජිත නව දෙමහල් සංඝාවාස ගොඩනැගිල්ලට අදාළ සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර නාගරික සංවර්ධන අධිකාරියට හා එස්.එම්.එස්. හෝල්ඩින්ස් ආයතනය වෙත භාරදීම.

V. තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල නවීකරණය කිරීමට අදාළ සැලසුම් සකස් කර භාර දී ඇත.

VI. " සිහිලැල් දැහැන" ව්‍යාපෘතිය යටතේ මීපේ පාදුක්ක මාවතගම ශ්‍රී වර්ධනාරාම මහා විහාරයෙහි බුද්ධ මන්දිරය ඉදිකිරීමට අදාළ සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර භාර දී ඇත.

VII. මුල්ලේගම පුරාණ රජමහා විහාරයෙහි ධර්මශාලා ගොඩනැගිල්ල ඉවත් කර නව ධර්ම ශාලාවක් ඉදිකිරීම සඳහා සැලසුම් ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත. භූමියෙහි පස් පරීක්ෂාව සිදු කිරීමට අවශ්‍ය පස් ලබාගෙන ඇත. (සිරි සුගත නන්දනාරාම පුරාණ විහාරය)

VIII. මුණ්ඩිගල ආරණ්‍ය සේනාසනයෙහි භාවනා කුටි සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර ලබා දී ඇත. ගොරකාන පුරාණ රජමහා විහාරයෙහි සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකිරියෙහි යෙදී ඇත. එය සකස් කරමින් පවතී.

IX. ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රජමහා විහාරයෙහි සංවර්ධන සැලැස්ම සකස් කොට භාර දී ඇත. ඉදිකිරීමට යෝජිත නව බහුකාර්යය ගොඩනැගිල්ල සඳහා වාස්තු විද්‍යා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කොට භාර දී ඇත.

X. අස්ගිරිය රජමහා විහාරයේ වාහල්කඩ ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම්, ඇස්තමේන්තු ලබාදීම හා ඉදිකිරීමේ දී අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

XI. මහනුවර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ ව්‍යාපෘති කාර්යාලය නවීකරණය කිරීමට අදාළ වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම හා සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම.

XII. අළුවිහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ පිටුපස බැම්ම හා වැට ඉවත් කර වළාකුළු බැම්මක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිකිරීමේ කටයුතු සඳහා භාරදීම.

XIII. අළුවිහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ හෙළ බොජුන්හලක් ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම් ලබාදීම.

XIV. අළුවිහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ සිල් මැණියන් සඳහා ආරාමයක් ඉදිකිරීමට වාස්තු විද්‍යාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු ලබාදීම.

XV. රත්නපුර මහ සමන් දේවාලයේ ඉදිකිරීමට යෝජිත පහත සඳහන් ගොඩනැගිලි සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කර දී ඇත.

a. රථගාල,රථගාල තුළ ඉදිකිරීමට යෝජිත වැසිකිළි පද්ධතිය,ස්වාමීන්වහන්සේලා සහ සේවක මණ්ඩලයේ භාවිතය සඳහා වැසිකිළි පද්ධතිය,නැට්ටුවන් සහ ඇත් ගොව්වන්ගේ පරිහරණය සඳහා වන ගොඩනැගිල්ල,අලි මඩුව,මල් කඩ සහ පළතුරු කඩ

XVI. අළුත්නුවර, උග්ගල්ල ශ්‍රී කතරගම දේවාලයේ සනීපාරක්ෂක ගොඩනැගිල්ල, නිලමේ නිල නිවස, වන්දනාකරුවන් හා නැට්ටුවන් සඳහා වන ගොඩනැගිල්ල, වෛද්‍යවරුන්ගේ පරිහරණය සඳහා සහ වෙඩි බෙහෙත් ගබඩා කිරීම සඳහා වන ගොඩනැගිල්ල සඳහා ගොඩනැගිලි සැලසුම් සකස් කර දී ඇත.

XVII. දැදිගම කොටවෙහෙර රජමහා විහාරය බහුකාර්ය ගොඩනැගිල්ල, වළාකුළු බැම්ම, වාහල්කඩ සඳහා සැලසුම් සකස් කර දී ඇත.

XVIII. අළුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය සඳහා වින්‍යාස සැලසුම, සනීපාරක්ෂක ගොඩනැගිල්ල, පළතුරු සකසන ස්ථානය, පොලිස් මුර කුටිය, පුංචි විහාර ගෙය සහ වාහන නැවතුම්පල අසල සනීපාරක්ෂක ගොඩනැගිල්ල සඳහා සැලසුම් සකස් කර දී ඇත.

XIX. වේරගල ලෙනගල රජමහා විහාරය පූජා භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

XX. දිඹුලාගල ආරණ්‍ය සේනාසනයේ දාන ශාලාව සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කරමින් පවතී.

XXI. දිඹුලාගල ඇල්ලේ වැව විහාරස්ථානයේ චෛත්‍ය සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරිම.

XXII. පුලතිසි නිකේතනයේ ශාලා 04 ක් අළුත්වැඩියා කිරිම.

XXIII. 2019 රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වූ ගාල්ල තෙල්වත්ත, තොටගමු රන්පත් රජමහා විහාරය පූජා භූමියක් ලෙස සංවර්ධනය කිරීමට පහත සඳහන් කටයුතු සිදු කිරීම

XXIV. වින්‍යාස සැලැස්ම සකස් කිරීම, දාන ශාලාව ඉදිකිරීම, සමරු ඵලකය ඉදිකිරීම, බැතිමතුන් සඳහා වැසිකිළි පද්ධතිය ඉදිකිරීම, වළාකුළු බැම්ම ඉදිකිරීම, පුස්තකාලය සහිත දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම හා ආරක්ෂිත බැම්ම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලදී.

XXV. බලපිටිය කප්පින වලව්ව මහා විහාරය, භික්ෂු නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සහ භික්ෂු අධ්‍යාපන හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරිම

XXVI. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමයේ ද්වාර සම්බන්ධයෙන් වාස්තු විද්‍යා සැළසුම්, ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.

XXVII. රුවන්වැලිසෑය සංඝාවාසය, අභයගිරිය දාන ශාලාව, ශ්‍රී මහා බෝධිය පොදු පහසුකම් ගොඩනැගිල්ල සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXVIII. වැව්රුකන්නල රජමහා විහාරය වාහල්කඩ හා වළාකුළු බැම්ම ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැළසුම් සකස් කිරිම

XXIX. මහා මන්තින්ද පිරිවෙණෙහි දාන ශාලාව සහිත දෙමහල් සංඝාවාසය ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ව්‍යුහාත්මක සැළසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම.

XXX. මුල්කිරිගල රජමහා විහාරය සඳහා වින්‍යාස සැලැස්ම සකස් කිරීම

XXXI. අම්බලන්තොට රන්ගිරි රජමහා විහාරය සඳහා වින්‍යාස සැලැස්ම සකස් කිරීම

XXXII. උඩුබද්දාව නගර සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතී. බිංගිරිය දේවගිරි රජමහා විහාරයේ කෞතුකාගාරය, භාවනා කුටි, පරිපාලන ගොඩනැගිල්ල, බණ ශාලාව සහ පහසුකම් ගොඩනැගිල්ල සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් සකසා ඇත.

XXXIII. තන්තිරිමලේ පූජා නගර සැලසුම් යෝජනා ක්‍රමයේ වැසිකිළි පද්ධතිය සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXXIV. තිරියාය ගිරිහඬුසෑය රජමහා විහාරයේ බුදු මැදුර සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXXV. දොඩංවල නාථ දේවාලයේ අම්බලම සඳහා සහ නර්තන ශිල්පීන් සහ වාදකයින් සඳහා වන වැසිකිළි පද්ධතියට වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXXVI. සේරුවාවිල විහාරයේ සනීපාරක්ෂක ගොඩනැගිල්ල සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXXVII. යාපනයේ සහ අනුරාධපුරයේ පැවති එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXXVIII. පූසාරි නිල නිවස, කතරගම තේවානි අම්මාන් දේවස්ථානය සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම.

XXXIX. කතරගම විශ්‍රාම ශාලාවේ පැරණි සහ නව ගොඩනැගිලි අළුත්වැඩියාව.

4.) **"පිබිදෙමු පොළොන්නරුව" සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සෞඛ්‍ය අංශයේ සිදු කරන ලද සංවර්ධන වැඩ කටයුතු සඳහා උපදේශන සේවා සැපයීම**

	ව්‍යාපෘතිය
01	වැලිකන්ද රෝහලේ විශේෂඥ වෛද්‍ය නිල නිවාස ඉදිකිරීම
02	වැලිකන්ද රෝහලේ බාහිර රෝගී අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම
03	වැලිකන්ද රෝහලේ මාතෘ හා ළමා සෞඛ්‍ය අංශය ඉදිකිරීම
04	පිහිටි වැව රෝහලේ සායන මධ්‍යස්ථානය ඉදිකිරීම
05	මනම්පිටිය රෝහලේ බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය, සායනය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම
06	මනම්පිටිය ආයුර්වේද ආරෝග්‍ය ශාලාව අළුත්වැඩියා කිරීම
07	බකමූණ රෝහලේ මෘත ශරීරාගාරය ඉදිකිරීම
08	අත්තනකඩවල රෝහලේ වෛද්‍යවරුන්ගේ විවේකාගාරය සහ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම
09	හිඟුරක්ගොඩ රෝහලේ දන්ත වෛද්‍ය ඒකකය ඉදිකිරීම
10	හිඟුරක්ගොඩ රෝහලේ භූ දර්ශන සැලැස්ම සැකසීම සහ ජලා අපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම - දන්ත වෛද්‍ය ඒකකයේ අළුත්වැඩියාව
11	හිගුරක්ගොඩ රෝහලේ වෛද්‍යවරුන්ගේ නිල නිවාස ඉදිකිරීම
12	හතරුස්කොටුව රෝහලේ ප්‍රාථමික වෛද්‍ය ඒකකය ඉදිකිරීම
13	හතරුස්කොටුව රෝහලේ ප්‍රාථමික සෞඛ්‍ය ඒකකය ඉදිකිරීම
14	හතරුස්කොටුව රෝහලේ ද්විත්ව හා කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම
15	මැදිරිගිරිය රෝහලේ වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා නිල නිවාසයක් ඉදිකිරීම - පළමුවන අදියර
16	මැදිරිගිරිය රෝහලේ වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා නිල නිවාසයක් ඉදිකිරීම - දෙවන අදියර

අභියෝග

1. දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟා කර ගැනීමේ දී, මානව සම්පත් හිඟකම මුහුණපා ඇති ප්‍රධානතම අභියෝගයයි. (දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය දැනට සිටිනුයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 70%ක ප්‍රමාණයකි.)
2. භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

ඉදිරි ඉලක්ක - 2020 වසරේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු.

1. වර්තමාන රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන සේ ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සහ එය ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ග්‍රන්ථයක් ලෙස එළි දැක්වීම.
2. මූලික වශයෙන් 2020 වසර තුළ ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් පළාත් දෙකක් නියෝජනය වන පරිදි කලාපීය භෞතික සැලසුම් දෙකක් සකස් කිරීම.
3. උඩුබද්දාව හා දමන සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීම. ඊට අමතරව ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීම පිළිබඳව සංගණනයක් සිදු කර ලැයිස්තුවක් පිළියෙල කර ප්‍රමුඛතාවය අනුව සැකසීම.
4. ලෝලුගස්වැව නව නගරය ඉදිකිරීම පිළිබඳ ව්‍යාපෘතියේ පළමුවන අදියර සඳහා භූමිය පිරිසිදු කිරීම, සවිස්තරාත්මක මිනින්දෝරු සැලැස්ම සකස් කිරීම, පළමුවන අදියරේ මාර්ග සංවර්ධනය සහ ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරීම.
5. පූජා භූමි සංවර්ධන ව්‍යාපෘති

I. කතරගම පූජා භූමිය.
- පොදු පහසුකම් ගොඩනැගිලි තුනක් ඉදිකිරීම
- කිරිවෙහෙර, වනජීවී ගේට්ටුව අසල (උතුරු පිවිසුමේ) සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කාර්යාලය අසල දැනට ඉදිකෙරෙමින් පවතින පොදු පහසුකම් ගොඩනැගිලිවල වැඩ නිම කිරීම.
- පූජා භූමිය වටා ඉදිකිරීමට නියමිත ආරක්ෂක වැට.
- විශ්‍රාම ශාලාව අළුත්වැඩියා කිරීම.

II. අනුරාධපුර පූජා භූමි සංවර්ධන යෝජනා ක්‍රමයේ ඉදිකිරීමට නියමිත පිවිසුම් දොරටු හතර ඉදිකිරීම ආරම්භ කිරීම.

III. තෙල්වත්ත පූජා භූමියේ යෝජිත දාන ශාලාව වාහල්කඩ, රථගාල සහ රැඳවුම් බැම්ම වාස්තු විද්‍යා සැලසුම්, ව්‍යුහ සැලසුම් ඇස්තමේන්තු සැපයීම හා ඉදිකිරීමේදී අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

IV. ඔලබොඩුව පූජා භූමියේ සංවර්ධන කටයුතු (ජාතික වෙසක් උත්සවයට සමගාමීව) බුදු මැදුර, දහම් පාසල් ගොඩනැගිල්ල සහ සංඝාවාස ගොඩනැගිල්ල සඳහා වාස්තු විද්‍යාත්මක හා ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු ලබා දීම සහ ඉදිකිරීම් කටයුතුවලදී අධීක්ෂණය සිදු කිරීම.

V. පොකුණුවිට කිස්තිරිමෙවන් රජමහා විහාර පූජා භූමියේ සංඝාවාසය ඉදිකිරීමේ අධීක්ෂණ කටයුතු.
- කෞතුකාගාරය, වැසිකිළි පද්ධතිය, බහුකාර්ය ගොඩනැගිල්ල, මුළුතැන්ගෙය, කෑම කාමරය සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් ව්‍යුහ සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- ගොඩනැගිලි ඉදිකිරීමේ දී අධීක්ෂණ කටයුතු.

VI. දැදිගම කොටවෙහෙර පූජා භූමි සංවර්ධන යෝජනා ක්‍රමය
- වින්‍යාස සැලැස්ම පිළියෙල කිරීම
- සංඝාවාසය, මුළුතැන්ගෙය, කෑම කාමරය සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- භූ දර්ශන සැලැස්ම සකස් කිරීම
- ගොඩනැගිලි ඉදිකිරීමේ අධීක්ෂණ කටයුතු

VII. මාතර මන්තින්ද විහාරය හා පිරිවෙන් පූජා භූමිය

- ආවාසය හා දාන ශාලාව සඳහා ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.
- ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

VIII. කෑගල්ල, උග්ගල්ල, අළුත්නුවර, කතරගම දේවාල පූජා භූමිවල

- විශ්‍රාම ශාලාව, සනීපාරක්ෂක ගොඩනැගිල්ල සහ නිලමේ නිල නිවාසය ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ඇස්තමේන්තු සකස් කිරීම හා ඉදිකිරීමේ දී අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- වින්‍යාස සැලැස්ම සකස් කිරීම.

IX. මාතලේ අළුවිහාර පූජා භූමි සංවර්ධන යෝජනා ක්‍රමය

- ත්‍රිපිටක කෞතුකාගාරය, වැසිකිළි පද්ධති දෙකක්, බහු කාර්ය ගොඩනැගිල්ල, මුළුතැන්ගෙය, කෑම කාමරයක් සහ භූ දර්ශන සැලැස්ම සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම.
- ඉදිකිරීම් කටයුතුවලදී අධීක්ෂණය.
- වින්‍යාස සැලැස්ම සකස් කිරීම.

X. පූජා භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.

- පූජා භූමි ලෙස සංවර්ධනය කළයුතු පූජා භූමි හඳුනා ගැනීම සඳහා පවතින නිර්ණායක සංශෝධනය කිරීම
- ඓතිහාසික වටිනාකමකින් යුත් ප්‍රදේශ සහ පූජනීය ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම සඳහා 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදු කිරීම.

XI. වර්ෂය පුරා බුද්ධ ශාසන අමාත්‍යාංශය මගින් හෝ විශේෂ ඉල්ලීම් මත ඉදිරිපත් වන පූජා භූමි ප්‍රදේශ ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

6.) මානව සම්පත් සංවර්ධනය සඳහා

I. දැනට පවතින පුරප්පාඩු පිරවීම.

II. ධාරිතා සංවර්ධන කටයුතු සඳහා නිලධාරී මණ්ඩලය සහභාගි කරවීමෙන් ඔවුන්ගේ ධාරිතාවය සංවර්ධනය කිරීම.

ඩබ්.එම්.කේ.පී.එස්.ආර්. ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

03 පරිච්ඡේදය- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2,019	තත්‍ය 2,018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
256,000,000.00	භාණ්ඩාගාර අග්‍රිම		237,542,000	209,693,353	ඒසීඒ-3
-	තැන්පතු		2,231,926	5,957,591	ඒසීඒ-4
8,300,000.00	අත්තිකාරම් ගිණුම්		13,372,871	11,052,643	ඒසීඒ-5/5(ඒ)/5(බී)
2,770,000.00	වෙනත් ලැබීම්		9,580,613	5,590,321	
267,070,000.00	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**262,727,410**	**232,293,908**	
267,070,000.00	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**262,727,410**	**232,293,908**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
146,000,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	131,456,763	131,821,788	
52,950,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	48,362,061	47,395,332	ඒසීඒ-2(ii)
1,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	777,767	2,422,111	
-	පොළී ගෙවීම්	8		-	
50,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	73,661	70,933	
200,000,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**180,670,252**	**181,710,164**	
	මූලධන වියදම්				
3,250,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	4,916,994	8,894,896	
2,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,373,615	18,973,919	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	
750,000.00	හැකියා වර්ධනය	14	330,400	478,000	
50,000,000.00	වෙනත් මූලධන වියදම්	15	4,881,424	359,850	
56,000,000.00	**මුළු මූලධන වියදම් (ඉ)**		**11,502,433**	**28,706,665**	
15,000,000.00	**ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)**		**12,858,087**	**19,809,188**	
	තැන්පතු ගෙවීම්		4,021,327	4,327,113	ඒසීඒ-4
15,000,000.00	**අත්තිකාරම් ගෙවීම්**		8,836,760	15,482,075	ඒසීඒ-5/5(ඒ)/5(බී)
271,000,000.00	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		**205,030,772**	**230,226,017**	
(3,930,000.00)	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**57,696,638**	**2,067,891**	

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	319,576,683.35	307,277,347.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	34,536,521.86	39,072,633.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**354,113,205.21**	**346,349,980.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		30,916,800.50	33,663,511.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		319,576,683.35	307,277,347.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	3,619,721.36	5,409,122.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**354,113,205.21**	**346,349,980.00**

පිටු අංක 05 සිට 53 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	අධ්‍යක්ෂ (මුදල්)
නම : ආචාර්ය (ඉංජි.) ප්‍රියත් බන්දු වික්‍රම	නම : මාධව වෛද්‍යාරත්න	නම : එල්.පී.චිත්‍රරන්ජන්
තනතුර : ලේකම්	තනතුර :	
දිනය : 2020.02.25	දිනය : 26/02/20	දිනය : 20/02/26

ආචාර්ය (ඉංජි.) ප්‍රියත් බන්දු වික්‍රම
ලේකම්
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ
නිවාස පහසුකම් අමාත්‍යාංශය
17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල

අධ්‍යක්ෂ (මුදල්)
ජාතික ජාතික ...
5 වන මහල "ඕ"
"සෙත්සිරිපාය" බත්තරමුල්ල.

		ඒසීඒ-සී
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තතාය	
	2019 රු.	**2018** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	10,277,950	13,454,623
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	237,542,000	206,365,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**247,819,950**	**219,819,623**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	180,670,252	181,710,164
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**180,670,252**	**181,710,164**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**67,149,698**	**38,109,459**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	1,444,254	1,416,662
ලාභාංශ		-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	90,335	4,980
උපණය අයකර ගැනීම්		-
අත්තිකාරම් අයකර ගැනීම්	13,372,871	11,052,643
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**14,907,460**	**12,474,285**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	15,523,760	33,033,777
අත්තිකාරම් ගෙවීම්	8,836,760	15,482,075
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**24,360,520**	**48,515,852**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(9,453,060)**	**(36,041,567)**
+ (ඊ)	**57,696,638**	**2,067,892**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**57,696,638**	**2,067,892**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01-R	රජයේ ගොඩනැගිලි කුළී ආදායම	2,000,000.00	2,000,000.00	1,428,357.80	71%
2002-02-99-R	පොලිය - අනෙකුත්	1,200,000.00	1,200,000.00	1,444,254.00	120%
2003-03-02-R	විකුණුම් සහ ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	200,000.00	200,000.00	246,600.00	123%
2003-99-00-R	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	200,000.00	200,000.00	751,561.08	376%%
2006-02-02-R	අනෙකුත් ප්‍රාග්ධන වත්කම් විකිණීම්	-	-	90,335.00	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුදල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	200,000,000.00	200,000,000.00	180,670,252.00	90%
ප්‍රාග්ධන	56,000,000.00	56,000,000.00	11,502,433.00	20%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වැය ශීර්ෂය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
162-02-03-23-2506(II)	මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	මෙත්සිත් අරණ	14,419,136.36	14,419,136.36	14,419,136.36	100%
104-02-06-06-2506	මුදල් අමාත්‍යාංශය	කතරගම පූජා භූමි සංවර්ධන ව්‍යාපෘතිය	99,700,000.00	99,700,000.00	39,621,150.86	39.7%
101-2-6-1-2205	බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය	රාජ්‍ය වෙසක් උත්සවය-තෙල්වත්ත	458,000.00	458,000.00	200,091.75	43.7%
102-01-02-16-1409	මුදල් අමාත්‍යාංශය	එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා	1,000,000.00	1,000,000.00	884,568.70	88.4%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2019.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2019.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	59,450,000.00	59,450,000.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	104,800,183.35	103,511,683.35	1,288,500.00	100%
9153	ඉඩම්	156,615,000.00	156,615,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-
				-	

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

එච්යූඩී/ඒ/එන්පීපීඩී/19/02/01 2020 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

.1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපීව ඉදිරිපත් කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී පසුගිය වර්ෂයේ අවසාන ශේෂය සඳහා ගැලපීම් සිදුකර සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හඳුනාගෙන තිබුණු නමුත් එම ගැලපීම් සඳහා ලබාගත් පසුගිය වර්ෂයේ අවසාන ශේෂයන්හි එකතුව රු.5,000,181 කින් අධිප්‍රමාණය වි තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුල වැය විෂයය අංක 1701 (පාඩු හා කපාහැරීම්) යටතේ රු.73,661 ක වියදම් දරා තිබුණද පුනරාවර්තන වැය ලෙජරයේ එම අගය සටහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී කතරගම විශ්‍රාම ශාලා දෙක පවත්වාගෙන යාමේදී ජලය හා විදුලිය සඳහා පමණක් රු.602,066 ක වියදම් දරා තිබුණු නමුත්, එක් විශ්‍රාම ශාලාවකින් කිසිඳු ආදායමක් ලැබී නොතිබුණු අතර අනෙත් විශ්‍රාම ශාලාවෙන් වර්ෂය තුලදී රු. 383,900 ක් පමණක් ආදායම් ලෙස ලැබී තිබුණි.

1.6.3 මූලධන වියදම්

අවශ්‍යතා අනුව වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු නොකර රු. 2,050,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සහිත ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය සඳහා මු.රෙ.66 මාරුකිරීම් මගින් සියයට 119 ක් එනම් රු. 2,446,000 ක ප්‍රතිපාදන මාරු කර ගැනීමට කටයුතු කර තිබුණි.

1.6.4 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගත යුතු වුවද ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ, කාර්යාලීය උපකරණ, විද්‍යුත් උපකරණ, සන්නිවේදන උපකරණ, ගෘහ භාණ්ඩ, කාර්මික හා කාර්මික නිෂ්පාදන උපකරණ, ඉදිකිරීම් උපකරණ සහ කෘෂිකාර්මික උපකරණ හා කිරි ගොවිපල උපකරණ වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම ශාලා 03 ක් සහ රථගාලක් ඉදිකර තිබුණද එම ඉදිකිරීම් සහිත ඉඩම් අත්පත් කරගෙන නොතිබුණු අතර, එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල කිසිඳු හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඇ) 2019 මාර්තු 19 දිනැති අංක MMWD/ADM/EST04/NPPD/04 දරන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි 2019 මැයි 31 දින දෙපාර්තමේන්තුව සතු රු. 3,580,000 ක් පමණ වටිනා වාහන 03 ක් අනුරාධපුර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත භාරදී ඇති නමුත් මූල්‍ය ප්‍රකාශනවල අදාල වත්කම් පැවරීම් ගිණුම් ගතකර නොතිබුණු අතර එසේම කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙතද මෙම වාහන පිළිබඳ විස්තර වාර්තා කර නොතිබුණි.

(ඈ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි දෙපාර්තමේන්තුව විසින් තානායම්, නිල නිවාස, සංචාරක බංගලා හා කාර්යාල හා ගොඩනැගිලි සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කල

මූල්‍ය නොවන වත්කම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල එම අගය අතර එකතුව රු. 3,615,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) යථෝක්ත චක්‍රලේඛය අනුව දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කල මූල්‍ය නොවන වත්කම් ලේඛනයේ ඇතුලත් වූ රු. 5,600,000 ක් වටිනා අංක PC – 2374 දරන වාහනය ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

1.6.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව තුල දැනට සේවය නොකරන නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු හිඟ ණය ශේෂය රු.1,346,632 ක් වූ අතර හිඟ හිටි කාලය වර්ෂ 5 ඉක්මවූ සේවය අතහැරගිය කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ආපදා ණය ශේෂය රු.30,000 ක් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය අවසානයට සංචාරක බංගලාවන්හි නවාතැන් ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ හිටි ආදායම රු. 346,200 ක් විය. ඒ තුල සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ ආදායම රු.83,300 ක් වූ අතර, ඉතිරි රු.262,900 ක හිඟ ආදායම වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ ආදායමෙන් සියයට 98 ක් එනම් රු.340,200 ක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතුව තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් සම්පූර්ණ හා නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන මාරු කිරීම්, ඉතිරිවීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු නොකර වැය විෂයයන් 05 ක් සඳහා මු.රෙ.66 මාරු කිරීම් මඟින් සියයට 30 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන මාරු කිරීම් සිදුකර තිබුණි.

(ආ) වාහන නඩත්තු වියදම්, වෙනත් වියදම්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් සියයට 40 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු අතර, රාජ්‍ය වියදම් කළමනාකරණය කරන ලෙස දන්වා තිබීම නිසා අදාල කාර්යයන් සිදුකර නොතිබුණු බව අධ්‍යක්ෂ ජනරාල් විසින් සඳහන් කර තිබුණි.

(ඇ) යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සඳහා වෙන්කළ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.47,554,000 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.4,881,424 ක් පමණක් වියදම් කර තිබූ අතර, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 90 ක් එනම් රු. 42,672,576 ක්

ඉතිරිවී තිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉඩම ලබාදීම ප්‍රමාදවීම නිසා සැලසුම් කල පරිදි කටයුතු සිදුකරගත නොහැකිවීම හේතුවෙන් අදාල කාර්යයන් සිදුකර නොතිබුණු බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 115(2) ප්‍රකාරව පූර්ව වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ගෙවිය යුතු හිමිකම්පෑම් නොවැළැක්විය හැකි තත්ත්වයන් යටතේ පමණක් ඊට පසු වර්ෂයේ මාර්තු මාසය අවසන්වීමට පෙර ගෙවිය හැකි වුවද 2019 වර්ෂයේ බැරකම් ලෙස සඳහන් කර ඇති එකතුව රු.115,540 ක වියදම් 2020 මාර්තු මාසය අවසන් වන තෙක් ගෙවීම් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 115(3) ට අනුකූල නොවන පරිදි 2019 මාර්තු මාසයේදී ආපසු ගෙවිය යුතු රු.175,950 ක රඳවාගත් මුදලක් ආපසු ගෙවීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණු අතර, 2020 ජනවාරි මාසයේදී එම මුදල සැපයුම්කරු වෙත ගෙවා තිබුණු නමුත් 2019 වර්ෂයේදී බැරකම් ලෙසද ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දුරකථන වියදම රු.29,906 ක් වුවද 2020 මාර්තු මාසය අවසානය දක්වා රු.30,862 ක් පසුගිය වර්ෂයේ දුරකථන වියදම් ලෙස ගෙවීම් කර තිබුණි.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

දෙපාර්තමේන්තුව වෙත කතරගම පූජා නගර සංවර්ධන ව්‍යාපෘතිය, රාජ්‍ය වෙසක් උත්සවය හා එන්ටර් ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ වලින් ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු. 60,078,849, රු. 257,908 ක් හා රු. 115,431 ක් එනම් සියයට 60, සියයට 56 සහ සියයට 12 බැගින් ඉතිරිවී තිබුණි.

2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුව තුල මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයේ ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එම පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අනුයුක්ත කළ නිල වාහන හිමිකම ඇති නිලධාරීන් සඳහා අතිරේක ඉන්ධන ප්‍රතිපාදන නොඉල්ලිය යුතු අතර, බැහැර ප්‍රදේශයන්හි රාජකාරි සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසනු ලැබුවද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරියෙකු වෙත රු. 822,766 ක් අතිරේක ඉන්ධන වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. එම වටිනාකම නිලධාරියාට වර්ෂය තුල හිමි සාමාන්‍ය ඉන්ධන දීමනාව මෙන් සිව් ගුණයක් ඉක්මවා තිබුණි.

2.7 අත්තිකාරම් නිකුත් කිරිම හා පියවීම

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ "ආ " ඡේදය ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අග්‍රිම පියවිය යුතු වුවද,

(අ) නිලධාරීන් දෙදෙනෙකු වෙත 2019 වර්ෂයේදී ලබාදුන් එකතුව රු.16,000 ක අතුරු අග්‍රිමයන් පියවීම සඳහා මාස 1 ½ සිට මාස 04 දක්වා කාලයක් ලබාගෙන තිබුණි.

(ආ) නිලධාරීන් තිදෙනෙකු විසින් ලබාගත් එකතුව රු. 24,000 ක අත්තිකාරම් දින 10 කට ආසන්න කාලයක් කිසිඳු කාර්යයක නොයොදා එම මුදලම ආපසු පියවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ

පී.එල්.කේ. පෙරේරා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුවේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
1. කතරගම අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලාව	√		
2. මිල දී ගන්නා ලද ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	√		
3. මිල දී ගන්නා ලද යන්ත්‍රෝපකරණ		√	
4. ජාතික භෞතික සැලැස්මේ සහ ප්‍රතිපත්තියේ ගැසට් පත්‍රය	√		
5. ප්‍රාදේශීය භෞතික සැලසුම් - 03			√
6. ලෝලුගස්වැව ව්‍යාපෘතියේ			
- වට මැනුම, සැලැස්ම	√		
- ඉදි කරන ලද ව්‍යාපෘති කාර්යාලය			√
7. කතරගම පූජා භූමි සංවර්ධන ව්‍යාපෘතිය			
I. පොදු පහසුකම් ගොඩනැගිලි තුනක් ඉදිකිරීම			√
II.පොලිස් මුරපොළවල් හතරක් ඉදි කිරීම	√		
III.ආරක්ෂක වැට ඉදිකිරීම		√	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
පරමාර්ථ අංක 11 අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇති කිරීම	ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම	ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන	√		
	ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණය ශක්තිමත් කිරීම මගින් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්හි සම්බන්ධතාවන් සඳහා සහාය වීම	කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ඇති ප්‍රධාන අභියෝගය වන්නේ මානව සම්පත් හිඟකමය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	51	11	40
තෘතීයික	08	03	05
ද්විතීයික	114	70	44
ප්‍රාථමික	177	157	20

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික යන සියළු මට්ටම් සැලකුවිට දැනට සිටින්නේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 70% කටත් වඩා අඩු සංඛ්‍යාවකි. 2019 වර්ෂය සඳහා සාදන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රාදේශීය භෞතික සැලසුම් 03 ක් සහ කලාපීය භෞතික සැලසුම් 03 ක් සෑදීමට බලාපොරොත්තු වුවද, මානව සම්පත් හිඟකම නිසා එම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි විය.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම	2	දින 01	10,000/-		දේශීය	ගිණුම් අංශයේ සහ පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
විනය පරීක්ෂණය	2	දින 01	14,000/-		දේශීය	ආයතනයේ විනය පිළිබඳ කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
වැටුප් පරිවර්ථන හා රාජ්‍ය සේවයේ වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	3	දින 01	11,400/-		දේශීය	ගිණුම් අංශයේ සහ පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
නිවාඩු භාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම	2	දින 01	6,000/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
ප්‍රවාහන කළමනාකරණය	2	දින 02	14,000/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම පිළිබඳ වැඩමුළුව	2	දින 01	7,200/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.

පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව පිළිබඳ වැඩමුළුව	2	දින 01	7,200/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
පාඩු කපාහැරීම් සහ පොතෙන් අස් කිරීම	2	දින 02	17,000/-		දේශීය	ගිණුම් අංශයේ සහ පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
Government Payroll System	2	දින 03	36,000/-		දේශීය	ගිණුම් අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
වර්තමාන කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය	3	දින 02	25,500/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
කාර්යාල කාර්ය සහයකයින්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ දැමීම	2	දින 02	17,000/-		දේශීය	දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
Infrastructure Planning and construction for sri lanka	1	දින 20		169521.39/-	විදේශීය	ආයතනයේ සැලසුම් කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී
Construction and management of Industrial Park for sri lanka	1	දින 20		170404.12/-	විදේශීය	ආයතනයේ සැලසුම් කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී
Salient features in Contract Administration in Construction	7	දින 01	28,000/-		දේශීය	ආයතනයේ සැලසුම් කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී
CIGAS Training	3	දින 4	මුදල් අය නොකෙරේ		දේශීය	ගිණුම් අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති	3	දින 01	10,800/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	7	දින 01	25,200/-		දේශීය	ගිණුම් අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව	5	දින 01	25,000/-		දේශීය	පාලන අංශයේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.
Seminar on the Belt and Road Construction & Advancement for Sri Lanka	3	දින 20		490469.7/-	විදේශීය	ආයතනයේ සැලසුම් කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී

කළමණාකරණ සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ සම්මන්ත්‍රණ මාලාව	3	දින 02	16,500/-		දේශීය	විභාගය සඳහා සූදානම් වන නිලධාරීන් යොමු කරන ලදී.
ආයතනික කණිෂ්ඨ සේවකයින් සඳහා අදාළ රාජකාරි ආගන්තුක සත්කාර සහ ආචාර විධි	6	දින 01	24,000/-		දේශීය	දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ		අදාල නොවේ
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		අදාල නොවේ
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		අදාල නොවේ
1.6	වෙනත්	අනුකූල නොවේ		අදාල නොවේ
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		නව ආකෘතියක් හඳුන්වාදී ඇත.
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		

9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		නීති ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා	අනුකූල වේ		

	ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		වාර්තාව සකසා අවසන් කර ඇත.
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පුරවැසියන් සමග කෙළින්ම ගණුදෙනු නොකරන බැවින්, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම අනවශ්‍ය වේ.		
18.2	එම චක්‍රලේඛයේ2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ		දෙපාර්තමේන්තුවේ සෑම නිලධාරියෙකුටම උචිත වන පරිදි පුහුණු ඉදිරිපත්ව නොතිබූ අතර, සහභාගිවූ බොහෝ පුහුණු වැඩමුළු පැය 08 වැඩමුළු වේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		